Sri Lanka Telecom Mobitel
We Care. Always.

## මාධ්‍ය නිවේදනය

# ‘හදවතින්ම ශ්‍රී ලාංකිකයි’ සමඟ මොබිටෙල් ශ්‍රී ලාංකීය ක්‍රිකට් පිටිය වර්ණවත් කරයි

2015 පෙබරවාරි 11, කොළඹ: මෙරට සමස්ත ක්‍රීඩාවන් සහ ක්‍රිකට් ක්‍රීඩාවෙහි උන්නතිය උදෙසා ඉමහත් දායකත්වයක් ලබාදෙන මොබිටෙල් මෙරට මිලියන ගණනක් වන ශ්‍රී ලාංකික ක්‍රිකට් ලෝලීන් වෙනුවෙන් එළැඹෙන ක්‍රිකට් තරගාවලිය ඉලක්ක කරගනිමින් ‘හදවතින්ම ශ්‍රී ලාංකිකයි’ යන නමින් සුවිශේෂී ගීතයක් එළිදැක්වීය. එතුළින් ක්‍රිකට් කණ්ඩායමෙහි ජයග්‍රහණය සඳහා අවශ්‍ය ක්‍රිකට් ලෝලීන්ගේ ප්‍රබෝධය ජනිත කරවීම මෙහි අරමුණයි.

ට්‍රයඩ් ඇඩ්වර්ටයිසින් ආයතනයේ වජිර මහකණුමුල්ල මහතාගේ පද රචනයෙන් බිහිවූ මෙම ගීතය මෙරට ජනප්‍රියතම ගායකයෙකු වන නලින් පෙරේරා ප්‍රමුඛ මේරියන්ස් සංගීත කණ්ඩායම විසින් ගායනය කරනු ලබයි. එළැඹෙන ක්‍රිකට් වසන්තයේ කාලයේ තාලයට ගැළපෙන තනුවකින් මෙම ගීතය සමන්විත වීම විශේෂත්වයකි. මෙම දැවැන්ත වූ ක්‍රීඩා උළෙලෙහි ජයග්‍රහය කරා යන්නට අවශ්‍ය ආශිර්වාදය සමඟින් අපගේ දේශයේ අලංකාරත්වය සහ විවිධ ජාතීන් අතර පවතින එක්සත් බව මෙම ගීතයෙහි අන්තර්ගතව ඇත. මෙම ගීතයේ තාලය ඇසෙන පමණින් තමන් ශ්‍රී ලාංකිකයෙකුය යන අභිමානය වඩාත් දැනවෙන සේ පසුගිය වසර තුළ අප රට ක්‍රිකට් ක්‍රීඩාව තුළ අත්කරගත් ජයග්‍රහණ මෙන්ම ලෝපතල කීර්තියට පත් අපගේ ක්‍රිකට් විරුවන් පසුගිය ජයග්‍රහණ අත්කරගැනීමෙහිලා ක්‍රියාකල ආකාරය දැක්වෙන සුවිශේෂී අවස්ථා ඉස්මතු වන ආකාරයෙන් එම ගීතයට අදාළ දෘෂ්‍ය නිර්මාණය සකස්ව ඇත.

මෙවන් ගීතයක් මොබිටෙල් වෙතින් එළිදැක්වෙන මෙම අවස්ථාව පිළිබඳව අදහස් දක්වමින් මොබිටෙල් සමාගමේ ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරී, වෙළඳ නලින් පෙරේරා මහතා මෙසේ පැවසී ය. “ මොබිටෙල් කවදත් රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතියට දායක වුණු සමාගමක්. ඒ වෙනුවෙන් අපි එදා මෙදාතුර වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර තිබෙනවා. මෙම ‘හදවතින්ම ශ්‍රී ලාංකිකයි’ ගීතය අපගේ ක්‍රිකට් ලෝලීන් මහත් සේ වැළඳ ගනු ඇති බව අපි විශ්වාස කරන අතර එතුළින් සමස්ත ජාතියෙහිම සහයෝගය මෙන්ම ප්‍රබෝධය අපගේ ක්‍රිකට් ක්‍රීඩකයන් වෙත ලබාදෙමින් මහඟු වූ ජයග්‍රහණක් කරා සමස්ත ජාතියම පෙළ ගැසෙනු ඇති බව අපගේ බලාපොරොත්තුවයි.’’

‘‘ඒ වගේම අනාගතය වෙනුවෙන් මීළඟ පරම්පරාවෙහි ක්‍රිකට් ක්‍රීඩකයන් බිහිකිරීම සඳහා අප දරන උත්සාහ සමග එක්වන ලෙසත් අපි මෙරට මිලියන 21 ක් වන ක්‍රිකට් ලෝලීන්ට ආරාධනා කර සිටිනවා. මෙම කර්තව්‍යයේ එක් පියවරක් ලෙස මෙම ගීතය ඩවුන්ලෝඩ් කරගැනීමෙන් අප ලබන ආදායම ග්‍රාමීය ප්‍රදේශයන්හි ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය උදෙසා ආයෝජනය කරන්නට අරමුණු කරගෙන සිටිනවා. මෙම ප්‍රතිලාභය සහ ඒ සඳහා වන අයැදුම්පත මෙතැනින් ලබාගත හැකියි. මෙම මහඟු කාර්යය සඳහා අප සමඟ එක්වන ලෙස මෙරට ක්‍රිකට් ලෝලීන්ට ආරාධනය කරන අතර එතුළින් අනාගත ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ කුසලතා නඟා සිටුවන්නට අවශ්‍ය දායකත්වය සැලසීමට ඔවුනට අවස්ථාව උදාවෙනවා’’ යැයි හෙතෙම වැඩිදුරටත් පැවසීය.

අද දින සිට 2015 අප්‍රේල් 10 දින දක්වා කාලය තුළ තම දුරකථනවලින් 74720000 අංකය ඩයල් කර ‘හදවතින්ම ශ්‍රී ලාංකිකයි’ ගීතය සක්‍රීය කරගැනීමෙන් පාරිභෝගිකයන්ට Galaxy Note 4 දුරකථනයක්

දිනාගැනීමට අවස්ථාව හිමිවේ. මේ ඔස්සේ වාසනාවන්ත ජයග්‍රාහකයන් 3 දෙනෙකුට Galaxy Note 4 දුරකථන හිමිවනු ඇත.

මොබිටෙල් 'mTunes' රිගින් ටෝන් සේවාව භාවිතා කිරීමෙන් පාරිභෝගිකයන්ට භාෂා කිහිපයකට අයත් විවිධ වර්ගයේ ගීත ඉතාමත් පහසුවෙන් ලබාගත හැක. 777 යන කෙටි කේත අංකය ඇතුළත් කිරීමෙන් හෝ mtunes.mobitel.lk වෙබ් ද්වාරයට පිවිසීමෙන් 'mTunes' සේවාව තම සිතැගියාවන්ට ගැළපෙන පරිදි භාවිතා කිරීමට ඔවුන්ට අවස්ථාව ලැබේ.

එළැඹෙන ක්‍රිකට් තරගාවලිය වෙනුවෙන් මොබිටෙල් සමාගම ක්‍රිකට් කණ්ඩායමට හදවතින්ම සුබපැතුම් එක්කරයි.




ඡායාරූපය- මොබිටෙල් ගෙනෙන 'හදවතින්ම ශ්‍රී ලාංකිකයි' ගීතය කොටුව දුම්රිය ස්ථාන පරිශ්‍රයේදී දියත් කළ අවස්ථාවේ එම ගීතය සඳහා නර්තන කණ්ඩයමක් විසින් ඉදිරිපත් කළ නර්තන අංගය ඡායාරූපයේ දැක්වෙයි.